ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ආරක්ෂක අමාත්‍යාංශය**

**කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය**

# ලංසු ආරාධනය (IFB)

## කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා වේදිකා ආලෝකකරණ පද්ධතිය සහ මෝටරයිස්ඩ් ෆ්ලයි බාර් පද්ධතිය (Motorized Fly Bar System) සැපයීම, ස්ථාපනය, පරීක්ෂාව සහ ක්‍රියාත්මක කිරීම

**කොන්ත්‍රාත් හැඳුනුම් අංකය: *MOD/KDU/02/2022***

1. රත්මලාන, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තර කර ඇති වේදිකා ආලෝකකරණ පද්ධතිය සහ මෝටරයිස්ඩ් ෆ්ලයි බාර් පද්ධතිය (Motorized Fly Bar System) සැපයීම, ස්ථාපනය, පරීක්ෂාව සහ ක්‍රියාත්මක කිරීම (කොන්ත්‍රාත් අංකය: MOD/KDU/02/2022) සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

   මෙම වැඩ කටයුතුවලට කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා වේදිකා ආලෝකකරණ පද්ධතිය සහ මෝටරයිස්ඩ් ෆ්ලයි බාර් පද්ධතිය (Motorized Fly Bar System) සැපයීම, ස්ථාපනය, පරීක්ෂාව සහ ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

   **ව්‍යාපෘති ස්ථානය:** ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය.

   ඉදිකිරීම් කාලය **දින 180 කි**.

2. ලංසු කැඳවීම **ජාතික තරඟකාරීත්ව ලංසු පටිපාටිය (NCB)** අනුව සිදු කෙරෙනු ඇත.

3. කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සුදුසුකම් ලැබීම සඳහා, ලංසුකරුවා අසාධුලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත අවශ්‍යතාවයන් සැපිරිය යුතුය.

   i. ලංසුකරුවා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ වන අවශ්‍යතා සැලකිල්ලට ගත යුතු අතර, පනතේ වැදගත් උධෘතයන් කිහිපයක් පහත දැක්වේ.

      අ. "ඕනෑම ලංසුකරුවෙකු වෙනුවෙන් නියෝජිතයෙකු හෝ උප නියෝජිතයෙකු, නියෝජිතයෙකු හෝ නාමිකයෙකු ලෙස ක්‍රියා කරන ඕනෑම තැනැත්තෙකු තමා සහ එම පොදු කොන්ත්‍රාත්තුව 10 වැනි වගන්තියට අනුව ලියාපදිංචි කළ යුතු අතර 6 වැනි වගන්තිය යටතේ ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු රෙජිස්ට්‍රාර් වෙත ලබා දිය යුතුය."

      ආ. "මෙම වගන්තිය යටතේ ඕනෑම පුද්ගලයෙක් ලංසුකරුවෙකු වෙනුවෙන් හෝ ඒ වෙනුවෙන් නියෝජිතයෙකු, උප නියෝජිතයෙකු, නියෝජිතයෙකු හෝ නාමිකයෙකු වන විට, තමා සහ පොදු කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමට පෙර නියෝජිත උප නියෝජිතයා, නියෝජිතයෙකු හෝ නාමිකයෙකු ලෙස ඔහු පත්කිරීමේ සහතිකයක් පළමුව රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය."

      ඇ. අදාළ නම්, 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව, ලංසු ලේඛනය මිලදී ගැනීමට පෙර ගෙවීම් ලදුපත හෝ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

   ii. ලංසුකරුට වේදිකා ආලෝක සවිකිරීම් හෝ මෝටරයිස්ඩ් ෆ්ලයි බාර් පද්ධති (Motorized Fly Bar System) පාලන සංරචක සඳහා ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදකයාගේ අවසරය තිබිය යුතුය.

   iii. ලංසුකරු පසුගිය වසර 10 තුළ මෙයට සමාන ආකාරයේ ව්‍යාපෘති දෙකක් (අවම වශයෙන් ආසන 400ක් සහිත ශ්‍රවණාගාරවල) සාර්ථකව නිම කර භාර දී තිබිය යුතු ය.

   iv. ලංසුකරු ආලෝක සවිකිරීම්, පාලක කොන්සෝල, ෆ්ලයි බාර් මෝටර සහ මෝටර් පාලන සඳහා දේශීය නියෝජිතයෙකු/සැපයුම්කරුවෙකු විය යුතුය.

4. කොන්ත්‍රාත්තු පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන සුදුසුකම්:

   අ) පසුගිය වසර 05 තුළ සිදු කළ සාමාන්‍ය වාර්ෂික ඉදිකිරීම් කටයුතුවල අගය **රු.මි. 350** හෝ ඊට වැඩි අගයකින් යුක්ත විය යුතුය. ලංසු ලේඛනය සමග පසුගිය වසර 05 සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය.

   ආ) පසුගිය වසර 05 තුළ ස්වභාවයෙන් සහ සංකීර්ණත්වයෙන් මෙයට සමාන වූ **රු.මි. 110 ක** අගයකින් යුතු අවම වශයෙන් එක් ව්‍යාපෘතියක් හෝ සාර්ථකව සම්පූර්ණ කළ කොන්ත්‍රාත්කරුවෙකු විය යුතු අතර, සම්පූර්ණ කිරීමේ සහතික පත් ඉදිරිපත් කළ යුතු ය.

   ඇ) අනෙක් කොන්ත්‍රාත්තුමය බැඳීම් සහ කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙන අත්තිකාරම් හැර අවම ද්‍රවශීලතා වත්කම් හෝ ණය පහසුකම්වල අගය **රු.මි. 90 ට නොඅඩු** විය යුතු ය.

5. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට පහත මාර්ගයෙන් වැඩි දුර විස්තර ලබාගත හැකිය.

   **ප්‍රධාන මූල්‍ය නිලධාරී I,**
   **දෙවන මහල,**
   **ආරක්ෂක අමාත්‍යාංශය,**
   **මූලස්ථාන සංකීර්ණය,**
   **ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,**
   **ශ්‍රී ලංකාව.**

   (ඊමේල්: procurement@defence.lk, දුරකථනය: 011-2439381, ෆැක්ස්: 011-2390720)

   ඉහත ලිපිනයේදී **2023.02.13 සිට 2023.03.07** දක්වා වැඩ කරන දිනවලදී **පැය 9.00 සහ පැය 15.00** අතර ගාස්තු විරහිතව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය. දුරකථනය 011-2439381, ෆැක්ස් 011-2390720 ඊමේල් procurement@defence.lk.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **රු.12,500.00** නැවත ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවා **2023.02.13** සිට **2023.03.07** දක්වා කාලය තුළ වැඩ කරන දිනවල **පැය 9.00 සහ පැය 15.00** අතර කාලය තුළ **ප්‍රධාන මූල්‍ය නිලධාරී I, දෙවන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ** වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදීගත හැකිය. ගෙවීමේ ක්‍රමය වන්නේ මුදල් මගින් ගෙවීමයි.

   ලංසුව සමග 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි සහතික ඉදිරිපත් කරන ලෙස (අදාළ වන විට) ලංසුකරුවන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.

7. **2023.02.21 දින පැය 10.00 ට රත්මලාන, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී** පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත. රැස්වීමෙන් අනතුරුව ක්ෂේත්‍ර සංචාරයක් සැලසුම් කෙරෙනු ඇත. පූර්ව ලංසු රැස්වීමට සහභාගිවීමට අපේක්ෂා කරන ලංසුකරුවන්, ප්‍රධාන මූල්‍ය නිලධාරී I, දෙවන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත සහභාගිවන්නන්ගේ විස්තර ලබා දිය යුතුය. (නම, හැඳුනුම්පත් අංකය, සමාගම සහ තනතුර) ඊ මේල් : procurement@defence.lk, දුරකථනය: 011-2439381 ෆැක්ස් : 011-2390720)

8. **2023.03.08 සිට 2023.06.07** දක්වා ලංසුව වලංගු විය යුතුය. (ලංසු භාරදීමේ අවසන් දිනයේ සිට දින 91)

9. සියලුම ලංසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත බැංකුවකින් **2023.03.08 සිට 2023.06.26** දක්වා (ලංසු විවෘත කිරීමේ දින සිට **ලිත් දින 119ක්**) වලංගු වෙන පරිදි නියමයක් රහිත ඉල්ලුම මත ඇපකරයක් ආකාරයෙන් ලබාගත් **රුපියල් මිලියන දෙකක් (රු.2,000,000.00)** "ලංසු සුරක්ෂණයක්" සමග ඉදිරිපත් කළ යුතු ය. ලංසු සුරක්ෂණයේ ප්‍රතිලාභියා විය යුත්තේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ය.

   ලංසු සුරක්ෂණයට **ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ** යන ලිපිනයට පක්ෂව නිකුත් කරන ලද ලංසු සුරක්ෂණය ඇතුළත් විය යුතුය.

10. මුද්‍රා තබන ලද ලංසු, **2023.03.08 දින පැය 1400ට** පෙර පහත ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර එසේ නැතහොත් එම ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය.

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී I,**
    **දෙවන මහල**
    **ආරක්ෂක අමාත්‍යාංශය**
    **මූලස්ථාන සංකීර්ණය,**
    **ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,**
    **ශ්‍රී ලංකාව.**

    ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

    ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ඇත.

11. ලංසු විවෘත කිරීමට අවම වශයෙන් දින තුනකට (03) පෙර ලංසු විවෘත කිරීමට සහභාගි වන පුද්ගලයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය/ගමන් බලපත්‍ර අංකය ලංසුකරුවන් විසින් ප්‍රධාන මූල්‍ය නිලධාරී I, දෙවන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ලිඛිතව දැන්විය යුතුය.

**සභාපති**
**ආරක්ෂක අමාත්‍යාංශය**
**මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,**
**ශ්‍රී ලංකාව,**
**2023.02.12**